**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.**

-------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

-----------------------------------------

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය වු ලෙස ගිණුම් වල දක්වා තිබුණු නමුත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා පිරිවැය රු.33,608,706ක් වු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) බාහිර ව්‍යාපෘති ආදායමෙන් මිලදී ගෙන තිබුණු රු.875,935ක් වු උපකරණ වල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අත්හැර තිබුණි.

(ඇ) ගබඩාවේ ඉතිරි තොගයේ වටිනාකම සහ ප්‍රකාශන තොගයේ වටිනාකම පිළිවෙලින් රු.215,928කින සහ රු.425,225කින අඩුවෙන් සහ කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් රු.75,389කන වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.2.2 **නොසැසඳු පාලන ගිණුම්**

--------------------------

විෂයයන් 03කට අදාල ගිණුම් හා උපලේඛන අතර රු.26,173ක වෙනසක් නිරීක්ෂණය වු අතර ඊට හේතු විමසා නිවැරදි කිරමට කටයුතු කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන රු.41,568ක්වු නොගෙවූ වැටුප් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැනට සේවයේ නොමැති නිලධාරින්ගෙන් අයවිය යුතු රු.58,750ක්වු ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ග තුලින් හෝ අයකර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදි කොන්ත්‍රාත් සහ සැපයුම් මත වු රඳවාගැනීම් වල වටිනාකම රු.12,329,892 ක් වූ අතර ඉන් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂ වල වටිනාකම රු.7,911,317ක් විය.

### 1.2.4 නිති, රිති, රෙගුලාසී හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් නිති, රිති, රෙගුලාසී හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලී විශ්වවිද්‍යාල පනතේ vii වන කොටසේ 32(ඇ) වගන්තිය | ස්වයංමූල්‍ය පාඨමාලා ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණු අතර ඉන් බැහැරව ඒවා පරිහරණය කර තිබුණි. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත | විශ්වවිද්‍යාලයේ සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික සඳහා වාර්ෂිකව වෙන් කිරීම් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසී | |
| (i) 371(2)(ආ) සහ (ඇ) වගන්ති | (අ) වරකට අතුරු අග්‍රිම ලබාදිය යුතු රු.20,000 උපරිම සීමාව ඉක්මවා විශ්වවිද්‍යාලය විසින් රු.21,000 සිට රු.77,200 දක්වා අත්තිකාරම් නිකුත් කර තිබු අතර එසේ සමාව ඉක්මවා වර්ෂය තුළ නිලධාරින් 06දෙනෙකු වෙත රු.533,940ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | (ආ)සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 05කදී දෙනලද එකතුව රු.78,527ක් වූ අත්තිකාරම් වලින් |

| | |
|---|---|
| | අදාල කාර්යයන් නිමකර අත්තිකාරම් පියවා නොතිබුණි. එමෙන්ම නිලධාරියෙකු වෙත නිකුත් කර ඇති එක් තත්කාර්ය අග්‍රිමයක් පියවීමට පෙර තවත් අග්‍රිමයන් නිකුත් කල අවස්ථා ද විගණනයට අනාවරණය විය. |
| | (ඇ)විශ්වවිද්‍යාලය විසින් මාණ්ඩලික නොවන නිලධාරීන් 22දෙනෙක වෙත වර්ෂය තුළ එකතුව රු.598,665ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) 571 වගන්තිය | එකතුව රු.20,000 ක් වු ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (iii) 756 වගන්තිය | ස්ථාවර වත්කම් සමීක්ෂණයක් පවත්වා ශේෂ තහවුරු කර ගෙන නොතිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය | |
| (i) X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | ආචාර්යවරුන් නිවාඩු ලබාගැනීම් වාර්තාකර නොතිබු අතර නිවාඩු ලේඛනයන් ද පවත්වා නොතිබුණි. |
| (ii) X වන පරිච්ඡේදයේ II කොටසෙහි 33 හා 34 වගන්තිය | විදේශ ගත වු ආචාර්යවරුන් 16 දෙනෙකුගෙන් 13 දෙනෙකු කිසිම ආකාරයේ ගිවිසුමකට එලඹ නොතිබු අතර අනෙක් 3දෙනා එලඹ තිබු ගිවිසුම්ද අසම්පූර්ණ ඒවා විය. |
| (iii) XX වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ආචාර්යවරුන් සිය පැමිණිම සනාථ කිරීම සඳහා පැමිණිමේ ලේඛනයක අත්සන් කර නොතිබුණි. මේ හේතුව නිසා සේවය හැරගිය ආචාර්යවරුන් සඳහා ද වැටුප් සකස් කර තිබුණි. |
| (ඊ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (උ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/අයිඑන්එස්/සීඑල්ටීඑස්-ඒ/078 හා 2003 ජූලි 18 දිනැති ලිපිය | (අ) සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.3,855,206ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර උක්ත දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ. |

(ආ)2007 වර්ෂයේදී විශ්‍රාම ගිය මහාචාර්යවරයෙකුට පාර්තෝෂිත මුදල් ගෙවීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් රු.132,291ක වැඩිපුර ගණනය කර ගෙවා තිබුණි.

### 1.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

----------------------------------------------------------

1984 නොවැම්බර් 24 දිනැති අංක PE/1/116/6 දරන භාණ්ඩාගාර ලිපිය අනුව වෛද්‍යාධාර අරමුදල සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් කෙරෙන දායකය අඩුකර ගැනීම සඳහා වෛද්‍යාධාර අරමුදලට අදාලව ජනිතවන පොළී මුදල් හා වෙනත් ආයෝජන ආදායම් දායකය ගෙවීම සඳහා උපයෝගී කරගත යුතු බවට උපදෙස් ලබා දී තිබුණ නමුත් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු.384,942 ක ආයෝජන ආදායම අඩු නොකර රු.1,717,684ක් වූ මුළු දායක මුදලම වෛද්‍යාධාර අරමුදලට බැර කර තිබුණි.

### 1.2.6 අවිධිමත් ගනුදෙනු

--------------------

බාහිර ව්‍යාපෘති පාඨමාලා 02ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.156,059ක් වැය කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.125,338,149ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ ඊට අනුරූප ඌනතාවය රු.111,391,478ක් වුයෙන් ඌනතාවයේ වැඩිවීම රු.13,946,671ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.82,170,000ක් වූ ප්‍රදානය ගනන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.43,168,149ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.40,998,478ක් වූයෙන් ඌනතාවයේ රු.2,169,671ක් වැඩිවීමක් නිරීක්ෂණය වේ.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.2.1 කාර්ය සාධනය

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුණු ඉටු කර ගැනීම.

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පර්යේෂණ පැවැත්වීම තුළින් දැනුම වර්ධනය කර ශිෂ්‍ය ප්‍රජාව සමාජයට මුදා හැරීම විශ්වවිද්‍යාලයක ප්‍රධාන මෙහෙවරක් වුවත් සමාලෝචිත වර්ෂයේ දී ජියුන් බෞද්ධ පර්යේෂණ ප්‍රකාශන අරමුදල කිසිදු පර්යේෂණ හා ප්‍රකාශන කටයුත්තක් සඳහා උපයෝජනය කර නොතිබුණු අතර එහි සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.1,646,614ක් විය.

(ii) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන මහෝපාධ්‍යා අරමුදල පිහිටුවීමට පාදක කරගත් ව්‍යවස්ථාපිත තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,944,896ක ශේෂයක් පැවතිණි. සමාලොචිත වර්ෂය තුල ගැස් සහනාධාරය සඳහා රු.191,646ක් සහ රු.1,236,847ක් වූ මුදලක් වියදම් කල ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය සඳහා රු.1,000,000ක් මෙම අරමුදලින් වියදම් කර තිබුණි.

(iii) විශ්වවිද්‍යාලය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කරීම සඳහා බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීමය. 1984 සිට 2010 දක්වා කාල සීමාව තුල ආචාර්ය, දර්ශනපති, ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා ආදී විභාග සමත් වූ සංඛ්‍යාව 4,996ක් විය.

(ආ) ශිෂ්‍යයන් බඳවා ගැනීම.

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරකදී සාමාන්‍ය උපාධි සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ඉල්ලුම් කල හා බඳවා ගත් දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලුම් කල සංඛ්‍යාව | | බඳවා ගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| 2006 | 362 | 62 | 110 | 62 |
| 2007 | 348 | 42 | 102 | 42 |
| 2008 | 293 | 61 | 109 | 61 |
| 2009 | 196 | 74 | 109 | 74 |
| 2010 | 353 | 45 | 109 | 45 |

2004 වර්ෂයේ සිට රු. මිලියන 512 ක් වැය කර සියළු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණද ඊට සාපේක්ෂව වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 544ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.142,049,552ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 546ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.131,868,318ක් විය. සමාලෝචිත වර්ෂයේ රු.261,120ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය ඉකුත් වර්ෂයේ රු.241,517ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය හා සසඳන විට 8.11%කින් වැඩි වී තිබුණි.

(ඇ) අධ්‍යයන කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා පීඨයේ හා බෞද්ධ අධ්‍යයන පීඨයේ 2010 අධ්‍යයන වර්ෂයේ කාල සටහන් අනුව එක් විෂයක් සඳහා සාමාන්‍ය වශයෙන් දේශන 30ක් පැවැත්විය යුතු වුවද විෂයන් 56ක් සඳහා දේශන 1,680කින් පවත්වා තිබුණේ දේශන 789ක් පමණි.

(ii) විභාගයට පෙනී සිටීමේ සුදුසුකමක් ලෙස දේශන වලට සහභාගි වීමේ අනිවාර්යය ප්‍රතිශතයක් සලකා නොබැලීම හේතුවෙන් දේශන සඳහා සිසුන්ගේ සහභාගිත්වය ඉතා දුර්වල මට්ටමක පැවතුණ අතර දේශන වලට සිසුන් සහභාගි නොවීම හේතුවෙන් විෂයයන් 41කට අදාල දේශන 144ක් පවත්වා නොතිබුණි. පැවැත්වූ දෙශන 290කදී සිසු සහභාගීත්වය 50%කටත් වඩා අඩු අවස්ථා 230ක් විය.

(iii) සිසුන් නොපැමිණීම මත බාහිර දේශකවරුන් දේශන නොපැවැත්වුවද, නොපැවැත්වූ දේශන 60ක් සඳහා රු.60,000ක මුදලක් අධ්‍යයන වර්ෂය තුල ගෙවා තිබුණි.

(iv) එක් එක් අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරුන් විසින් සතියකට පවත්වන දේශන පැය ගණන පරීක්ෂා කිරීමේ දී ස්ථිර කථිකාචාර්යවරුන්ට සාපේක්ෂව තාවකාලික හා ආධුනික කථිකාචාර්යවරුන් විසින් වැඩි පැය ගණනක් දේශන පවත්වා තිබුණු අතර ඊට හේතු වූ කරුණු පැහැදිලි නොකෙරිණි.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේදී ආරම්භ කරන ලද සංවර්ධන අරමුදල යොදා ගතයුතු කටයුතු පිළිබඳ නිර්ණායකයන් පිළියෙල කර නොතිබුණු අතර 2010 දෙසැම්බර් 31 දින වන විට එහි ශේෂය රු.510,293ක් විය. අරමුදලින් 2002 වර්ෂයේ සිට ආපන ශාලාවට රු.99,505 ක වටිනා ගැස් සැපයීම පමණක් සිදුකර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය දැනට භුක්ති විඳින බස්නාහිර පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම, ඉඩම්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, වාරිමාර්ග සහ ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශය සතු අක්කර 5 පර්චස් 0.27ක් වූ ඉඩම 2002 දෙසැම්බර් 05 දින විශ්වවිද්‍යාලයට පැවරීමේදී ඉදිරිපත් කල කොන්දේසි අතරින් මෙම ඉඩම බද්දක් මත ලබාගත යුතුය යන කොන්දේසිය ඉටුකර නොතිබුණි.

### 2.2.3 වෙනත් රාජ්‍ය ආයතනවලින් ලබාගත් සම්පත්

-----------------------------------------------------

බුද්ධ සාසන අමාත්‍යාංශයට හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මෝටර් රථ දෙකක් විශ්වවිද්‍යාලය විසින් පරිහරනය කලද ඒවා නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------------

රු. මිලියන 28ක් (එකතු කල අගය මත බදු රහිතව) වැයකර අංග සම්පූර්ණ ශ්‍රවණාගාරයක් ඉදිකර ඇතත් එය පරිශීලනය සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් විගණනයට ඉදිරිපත් නොකළ අතර සමාලෝචිත වර්ෂයේ දී ද ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගෙන නොතිබුණි.

### 2.2.5 කාර්ය මණ්ඩල පිරිවැය

-------------------------

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, අනධ්‍යයන 15ක් හා අධ්‍යයන 04ක් වශයෙන් පුරප්පාඩු 19ක් පැවතිණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) පුස්තකාල කළමනාකරණය

(ඇ) ඉදිකිරීම්

(ඈ) අභ්‍යන්තර පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) බාහිර ව්‍යාපෘති වලට අදාල ගිණුම්කරණය

(උ) පෞද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම